ජාතික විද්‍යා පදනම - 2014

ජාතික විද්‍යා පදනමේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ **14(2)**(සී) වගන්තිය ප්‍රකාර කොමිසමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,** මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සියලුම වත්කම් හා වගකීම් ද්‍රවශීලතාවය අනුපිළිවෙලට ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයකර ගැනීමට ඇති රු.4,822,697ක් වූ ආපදා ණය ශේෂයෙන් අයකර ගැනීම වසරකට අධික කාලයක් ගතවන ණය ශේෂය හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) රාජ්‍ය ප්‍රදාන වලින් ඉදිකල බහලුම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.382,690ක් වෙනුවෙන් ක්‍රමක්ෂය ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති හඳුනා නොගන්නා ලද සෘජු බැර රු. 141,311 ක මුදල ආදායම් ප්‍රකාශයට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට වසර දෙකකට වඩා කල් ඉකුත් වූ එකතුව රු.789,649ක් වූ ණයගිම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(ඇ) | තත් කාර්යය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවද අවස්ථා 09කදී ලබාදෙන ලද එකතුව රු.1,726,100ක් වූ මුදල් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණු අතර ඉන් රු.266,600ක අත්තිකාරම් වසරකට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) වගන්තිය. | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.2,040,000ක් වටිනා පරිගණක 20 මිලදී ගැනීම සඳහා අවම වශයෙන් ආයතන 5කින් මිල ගණන් කැඳවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.9,478,985ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.4,401,216ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,880,204ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රදාන රු.22,894,000කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ඇතිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **2012,2013** හා 2014 වර්ෂවලදී පදනම විසින් රු.80,016,591ක් වටිනා පර්යේෂණ 54ක් නිමකර තිබුණු අතර ඉන් 2014 වර්ෂයේ නිමකරන ලද මූලික හා ව්‍යවහාර පර්යේෂණ වලින් තාක්ෂණ පැවරීම් සඳහා පර්යේෂණ වාර්තා 2ක් යොමුකර තිබූ අතර ඒ සඳහා රු.9,700,000 ක් ලබාදිය යුතු වුවද**,** 2014 දෙසැම්බර් 31 දිනවන විට ප්‍රදානය කර තිබුනේ රු. 100,000 ක් පමණි.

(ආ) පර්යේෂණ ව්‍යාපෘතිවල අවසන් වාර්තා ඇගැයීම් කමිටුවක් මගින් ඇගැයීමට ලක්කර නිර්දේශ ලබාදෙන අතර එවැනි වාර්තා සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ අවසන් කිරීම සඳහා සහ අවසන් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අසාමාන්‍ය කාල ප්‍රමාදයන් ඇතිවීම.

(ii) අවසන් වාර්තා නියමිත ප්‍රමිතියකින් යුක්තව ඉදිරිපත් නොවීම.

(iii) අපේක්ෂිත අරමුණු කරා ලඟා වී නොතිබීම.

(iv) වාර්තාව සාර්ථක වාර්තාවක් ලෙස නිර්දේශ වුවද, පර්යේෂණය වාර්තාවකට පමණක් සීමාවී තිබීම.

(v) වාර්තා ඇගැයීමෙන් පසුව රටට ඵලදායී ලෙස යොදා ගැනීමට උනන්දු නොකිරීම.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පර්යේෂණ ගිවිසුමට අනුව ප්‍රදානයක කටයුතු අවසන් වූ වහාම ප්‍රදානලාභියා විසින් අවසන්වාර්තාව සමඟ ඉතිරි මුදල් ශේෂය පියවිය යුතු වුවත් පර්යේෂණ 09 කට අදාළව ප්‍රදාන ලාභීන් විසින් එකතුව රු.2,798,134ක මුදලක් ප්‍රතිපූරණයකර නොතිබුණි.

4.3 හඳුනාගත් පාඩු

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 2006 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා දායක මුදල් අඩුවෙන් ගෙවීම හේතුවෙන් රු.408,301ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ කළමනාකරණ තොරතුරු පද්ධතිය පරිගණකගත කිරීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල සමඟ 2011 පෙබරවාරි 15 දින රු.2,999,000ක් වටිනා ගිවිසුමකට එළඹ තිබූ අතර, එම කාර්ය 2012 ජුනි 14 දින වන විට නිම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිමකර නොතිබූ අතර ඒ වෙනුවෙන් රු.1,157,100ක වියදමක් දරා තිබුණි.

(ආ) පදනම විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.9,132,365ක් වටිනා උපකරණ ප්‍රදාන ලබා දී තිබුණි.

**(i)** ප්‍රදානයට අදාල ගිවිසුම අනුව උපකරණය මිලදී ගත් පසු එම ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කර එහි පිටපතක් හා භාණ්ඩ ලැබීමේ තුන්ඩුවේ පිටපතක් පදනම වෙත එවිය යුතු වුවත් එකතුව රු.7,486,653ක් වටිනා උපකරණ ප්‍රදාන 05ක් සඳහා එසේ කර නොතිබුණි.

**(ii)** මිලදී ගැනීම් සිදුකල පසු අදාල ආයතනය හා සැපයුම්කරු අතර නඩත්තු ගිවිසුමක් අත්සන් කල යුතු වුවත් ප්‍රදානයන් 02ක් සම්බන්ධයෙන් එවැනි නඩත්තු ගිවිසුමකට එළඹ නොතිබුණි

**(iii)** ප්‍රගති වාර්තා සැකසීම පිළිබඳ මාර්ගෝපදේශය අනුව පළමු ප්‍රගති වාර්තාව ප්‍රදාන ලබා දී වර්ෂයක් තුල එවිය යුතු වුවත්, ප්‍රදාන 07ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින පිළිවෙලින් රු.1,829,977ක් හා රු.6,747,380ක් වූ **Man & Biosphere Fund** සහ **Scientific Reserve Fund** යන අරමුදල් 2ක් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් ශේෂ 04ක එකතුව රු.5,798,120ක් වූ අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු. මිලියන 632ක මුදලක් නැන්කෝ පුද්ගලික සමාගමෙහි කොටස් වල ආයෝජනය කර තිබුණ අතර, ඒ සඳහා 19,050,909ක සාමාන්‍ය කොටස් සහතික පත් හා 45,248,286ක වරණීය කොටස් සහතික පත්‍ර ජාතික විද්‍යා පදනම නමින් නිකුත් කර තිබුණි. 2011 දෙසැම්බර් 14 දින ප්‍රසිද්ධ කර ඇති අංක 1736/23 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අදාල සමාගම තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතට පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වන විටද කිසිදු ප්‍රතිලාභයක් පදනම වෙත ලැබී නොතිබුණි.

4.7 කාර්යාල මණ්ඩල කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** 2014 දෙසැම්බර් 31 වන විට නිලධාරීන් 19ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු වලින් 14ක් විධායක ශ්‍රේණියේ තනතුරු විය.

**(ii)** පදනමේ ගිණුම් නිලධාරින් බඳවා ගැනීම සඳහා වූ පරිපාලන ගැටළුව සම්බන්ධයෙන් බාහිර පරීක්ෂණ නිලධාරියෙකු පත්කර තිබුණ ද, පරීක්ෂණ කටයුතු පවත්වා අවශ්‍ය පියවර ගැනීමට 2015 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

**(iii)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියට අනුව පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

------------------------------------

5.1. ක්‍රියාකාරී සැලැස්ම

--------------------

මූල්‍ය හා භෞතික ඉලක්කයන් සපුරා ගනු ලබන ආකාරය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මෙන් පෙන්නුම් කල යුතු වුවත්, පදනම විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරි සැලැස්මෙහි භෞතික ඉලක්කයන් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් භෞතික කාර්ය සාධනය ඇගැයීමට ලක්කල නොහැකි විය.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පදනමේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය.

(ආ) තොග පාලනය.